Lesson 67 **The Mysterious Night**

අද්භූත රාත්‍රිය

It was getting dark, and a light drizzle had started to fall. Charith didn't know what to do. His car had suddenly stopped on a narrow hill path

ඉට් වෝස් ගෙටිං ඩා(ර්)ක්, ඇන්ඩ් අ ලයිට් ඩ්‍රිස්ල් හෑඩ් ස්ටාටඩ් ටු ෆෝල්. චරිත් ඩිඩ්න්ට් නෝ වට් ටු ඩූ. හිස් කා(ර්) හෑඩ් සඩ්න්ලි ස්ටොප්ඩ් ඔන් අ නැරෝ හිල් පාත්.

අඳුර වැටෙමින් තිබුණි , එමෙන්ම සිහින් පොද වැස්සක්ද ද ඇද හැලෙන්නට පටන් ගෙන තිබුණි .කුමක් කරන්න දැයි චරිත් දැන සිටියේ නැත. ඔහුගේ කාරය පටු කඳු පාරක් මත හදිසියේම නතරව තිබුණි ( narrow - පටු )

He was still 10 kilometers away from his destination. He estimated it would take at least another 40 minutes to reach there on that narrow path, even if his car had been working.

හී වෝස් ස්ටිල් ටෙන් කිලෝමීට(ර්)ස් අවේ ෆ්‍රොම් හිස් ඩෙස්ටිනේෂන්. හී එස්ටිමේටඩ් ඉට් වුඩ් ටේක් ඇට් ලීස්ට් අනද(ර්) ෆෝටි මිනිට්ස් ටු රීච් දෙයා ඔන් දැට් නැරෝ පාත් , ඊවන් ඉෆ් හිස් කා(ර්) හෑඩ් බීන් ව(ර්)කිං.

ඔහු තවමත් ඔහුගේ ගමනාන්තයෙන් කිලෝ මීටර් 10 ක් එපිට සිටියේය . ඔහුගේ කාරය වැඩ කලත් , ඒ පටු මාවතේ එහි ලගා වීමට අඩුම තරමින් තව විනාඩි 4ක් වත් යනු ඇතැයි ඔහු ගණනය කළේය (destination - ගමනාන්තය)

Sitting inside the car, he paused to think. If he could find a place to get his car checked, he might still make it in time. He began to regret starting his journey so late. He should have left earlier.

සිටිං ඉන්සයිඩ් ද කා(ර්), හී පෝස්ඩ් ටු තිංක්. ඉෆ් හී කුඩ් ෆයින්ඩ් අ ප්ලේස් ටු ගෙට් හිස් කා(ර්) චෙක්ට්, හී මයිට් ස්ටිල් මේක් ඉට් ඉන් ටයිම්. හී බිගෑන් ටු රිග්‍රෙට් ස්ටාටිං හිස් ජ(ර්)නි සෝ ලේට්. හී ෂුඩ් හෑව් ලෙෆ්ට් අ(ර්)ලිය(ර්).

කාරය තුල හිඳ සිටිමින් , ඔහු මදක් නතරව කල්පනා කළේය . ඔහුට කාරය පරික්ෂා කරගැනීමට යමෙකු සොයා ගත හැකි නම් ඔහුට තවමත් වෙලාවට එහි යාමට ඉඩ ඇත. තම ගමන බොහෝ ප්‍රමාද වී ආරම්භ කිරීම ගැන ඔහු පසුතැවිලි වීමට පටන් ගත්තේය .ඔහු ඊට වඩා වේලාසනින් පිටත් විය යුතුව තිබුණි (pause -නතර වෙනවා )

Just then, he saw a figure walking toward him. The man looked like a Tamil estate worker. Charith waited for him to come closer.

ජස්ට් දෙන්, හී සෝ අ ෆිග(ර්) වෝකිං ටුවෝඩ් හිම්. ද මෑන් ලුක්ඩ් ලයික් අ ටැමිල් එස්ටේට් ව(ර්)ක(ර්). චරිත් වේටඩ් ෆෝ හිම් ටු කම් ක්ලෝස(ර්)

එවිටම , යම් තැනැත්තෙකු ඔහු දෙසට ඇවිදන් එනු ඔහු දුටුවේය .ඒ මිනිසා දෙමල වතු කම්කරුවෙකු මෙන් පෙනුනි. චරිත් ඔහු ලං වන තුරු බලා සිටියේය (figure - පුද්ගලයෙක් )

The man walked slowly, holding an umbrella, his eyes fixed on the ground. Even as he approached the car, he didn't look up or show any interest in the strange vehicle stopped by the road.

ද මෑන් වෝක්ඩ් ස්ලෝලි, හෝල්ඩිං ඇන් අම්බ්‍රෙල්ලා, හිස් අයිස් ෆික්ස්ඩ් ඔන් ද ග්‍රවුන්ඩ්. ඊවන් ඈස් හී අප්‍රෝච්ඩ් ද කා(ර්), හි ඩිඩ්න්ට් ලුක් අප් (ලුකප්) ඕ ෂෝ එනි ඉන්ටරෙස්ට් ඉන් ද ස්ට්‍රේන්ජ් වෙහිකල් ස්ටොප්ඩ් බයි ද රෝඩ්.

ඒ මිනිසා කුඩයක් රැගෙන , ඔහුගේ ඇස් බිමදෙසට නැඹුරු කරගෙන සෙමින් ගමන් කළේය .කාරය ලඟට එන විටවත් ඔහු හිස ඔසවා බැලුවේ හෝ පාර අයිනේ නවතා තිබෙන අමුරු පුදුම වාහනය ගැන කිසිම උනන්දුවක් පෙන්වූයේ නැත . (evan as - වන විටත් )

As the man was passing by, Charith rolled down the window and spoke

ඈස් ද මෑන් වෝස් පාසිං බයි, චරිත් රෝල්ඩ් ඩවුන් ද වින්ඩෝ ඇන්ඩ් ස්පෝක්

මිනිසා පසුකර යත්ම ,චරිත් කාරයේ වීදුරුව පහත් කර කතා කළේය (pass by - පසුකර යනවා )

"Aiye , is there a garage nearby or someone who can repair cars? My car broke down, and I'm on my way to Wogan Estate. I'll be in big trouble if I can't get it fixed," Charith said.

"අයියේ , ඉස් දෙයා අ ගරාජ් නිය(ර්)බයි ඕ සම්වන් හූ කැන් රිපෙයා කා(ර්)ස්? මයි කා(ර්) බ්‍රෝක් ඩවුන්, ඇන්ඩ් අයිම් ඔන් මයි වේ ටු වෝගන් එස්ටේට්. අයිල් බී ඉන් බිග් ට්‍රබල් ඉෆ් අයි කාන්ට් ගෙට් ඉට් ෆික්ස්ඩ් ," චරිත් සේඩ්

"අයියේ , මේ හරියේ ගරාජ් එකක් තියෙනවද ? එහෙම නැත්නම් කාර් හදන්න දන්නා කෙනෙක් ඉන්නවද ? මම වෝගන් වත්තට යන ගමන්. මම ලොකු කරදරේක වැටෙනවා මට මේක හදාගන්න බැරිවුනොත් "

The man still didn’t look directly at him. Instead, he pointed behind him toward a small house by the roadside, about 50 meters ahead.

ද මෑන් ස්ටිල් ඩිඩ්න්ට් ලුක් ඩිරෙක්ට්ලි ඇට් හිම්. ඉන්ස්ටෙඩ්, හී පොයින්ටඩ් බිහයින්ඩ් හිම් ටුවෝඩ් අ ස්මෝල් හවුස් බයි ද රෝඩ්සයිඩ්, අබවුට් ෆිෆ්ටි මීට(ර්)ස් අහෙඩ්

ඒ මිනිසා තවමත් ඔහු දෙස කෙලින් නොබැලුවේය. ඒ වෙනුවට ඔහු ඔහුගේ පිටුපසට අත දිගු කර ,මීටර් 50ක් පමණ ඉදිරියෙන් පාර අයිනේ වූ කුඩා නිවසක් පෙන්වූයේය

"Ask the man in that house, gentleman. I don’t know," he said softly, then continued walking past the car

"ආස්ක් ද මෑන් ඉන් දැට් හවුස්, ජෙන්ට්ල්මන්. අයි ඩෝන්ට් නෝ," හී සේඩ් සොෆ්ට්ලි, දෙන් කන්ටිනියුඩ් වෝකිං පාස්ට් ද කා(ර්)

“අර ගෙදර මනුස්සයගෙන් අහන්න මහත්තයා , මම දන්නේ නැහැ. “ ඔහු සෙමෙන් කීවේය .අනතුරුව කාරය පසුකර දිගටම ඇවිදන් ගියේය

Charith sighed in relief. At least there might be someone up there who could help. It was almost dark now. He grabbed his torch, got out of the car, and walked up the small path to the house

චරිත් සයිඩ් ඉන් රිලීෆ්. ඇට් ලීස්ට් දෙයා මයිට් බී සම්වන් අප් දෙයා හූ කුඩ් හෙල්ප්. ඉට් වෝස් ඕල්මෝස්ට් ඩාක් නව්. හී ග්‍රැබ්ඩ් හිස් ටෝච්, ගොට් අවුට් ඔෆ් ද කා(ර්), ඇන්ඩ් වෝක්ඩ් අප් ද ස්මෝල් පාත් ටු ද හවුස්

චරිත් සැනසුම් සුසුමක් හෙලුවේය .අඩුම තරමින් උදව් කල හැකි කව්රුන් හෝ එහි සිටිනු ඇත .දැන් හොඳටම අඳුර වැටී තිබුණි . ඔහු තම ටෝචය ගෙන කාරයෙන් බැස කුඩා පාර දිගේ ඒ නිවසට ඇවිද ගියේය (sigh - සුසුම් හෙළනවා ) ( relief - සහනය ) (grab - අල්ල ගන්නවා /අතට ගන්නවා )

The house looked old and run-down. There was no light coming from inside. The veranda was dirty and untidy. A musty smell filled the air. He knocked on the door several times, but there was no response.

ද හවුස් ලුක්ඩ් ඕල්ඩ් ඇන්ඩ් රන්-ඩවුන්. දෙයා වෝස් නෝ ලයිට් කමිං ෆ්‍රොම් ඉන්සයිඩ්. ද

වෙරන්ඩා වෝස් ඩ(ර්)ටි ඇන්ඩ් අන්ටයිඩ්. අ මස්ටි ස්මෙල් ෆිල්ඩ් දි එයා . හී නොක්ට් ඔන් ද ඩෝ සේවරල් ටයිම්ස්, බට් දෙයා වෝස් නෝ රෙස්පොන්ස්.

ගෙය, පරණ සහ ගරාවැටුණු බවක් පෙනුනි . ඇතුලතින් කිසිම එළියක් පැමිණුනේ නැත .ඉස්තෝප්පුව බෙහෙවින් අපිළිවෙල සහ අපිරිසිදු විය .පුස් ගඳක් වාතය පුරවාලීය .ඔහු කිහිප වරක් දොරට තට්ටු කළේය. නමුත් ප්‍රතිචාරයක් නොවීය. (run- down - අබලි /ගරා වැටුණු ) (musty - මස්ටි - පුස් සහිත )

“Who’s in there, please?” he shouted.
"හූස් ඉන් දෙයා , ප්ලීස්?" හී ෂවුටඩ්.
“කව්ද ඇතුලේ ඉන්නේ “ ඔහු හඬ නැගුවේය

Still, there was no answer. The place looked abandoned, but Charith had a strange feeling that someone was inside. He knocked again, this time louder

ස්ටිල්, දෙයා වෝස් නෝ ආන්ස(ර්). ද ප්ලේස් ලුක්ඩ් අබැන්ඩන්ඩ්, බට් චරිත් හෑඩ් අ ස්ට්‍රේන්ජ් ෆීලිං දැට් සම්වන් වෝස් ඉන්සයිඩ්. හී නොක්ඩ් අගේන්, දිස් ටයිම් ලවුඩ(ර්)

තවමත් කිසිඳු පිළිතුරක් නොවීය. ස්ථනය අතහැර දැමූ බවක් පෙනුනි, නමුත් කව්රුන් හෝ ඇතුලත සිටිනවා යයි අරුම සිතිවිල්ලක් චරිත්ට තිබුණි. ඔහු නැවත වරක් තවත් හයියෙන් තට්ටු කළේය (abandoned - අත්හැර දැමූ )

“Hello? Anyone inside? Please open the door! I’m in trouble!”
"හෙලෝ? එනිවන් ඉන්සයිඩ්? ප්ලීස් ඕපන් ද ඩෝ(ර්) ! අයිම් ඉන් ට්‍රබල්!"
“හලෝ , කව්රු හරි ඇතුලේ ඉන්නවද ? කරුණාකර දොර අරින්න , මම කරදරේක “

Suddenly, the door creaked open. A terrible smell came out with it. An old man appeared, holding a burning torch in his hand.

සඩ්න්ලි, ද ඩෝ ක්‍රීක්ඩ් ඕපන්. අ ටෙරිබල් ස්මෙල් කේම් අවුට් විත් ඉට්. ඇන් ඕල්ඩ් මෑන් ඇපියර්)ඩ්, හෝල්ඩිං අ බ(ර්)නිං ටෝච් ඉන් හිස් හෑන්ඩ්

හදිසියේම දොර කිරි කිරි ගා විවර විය .ඒ සමඟම එතුලින් පිටතට ආවේ මහා දරුණු ඝන්ධයකි . දැල්වෙන පන්දමක් අතැතිව මහලු මිනිසෙකු පෙනී සිටියේය ( creak - ක්‍රීස් ශබ්ධය / කිරිකිරි ශබ්දය නගනවා )

"Grandpa, my car broke down. It's just down the road, about 50 meters away," Charith explained, pointing back toward his car. "I have to drive another 10 kilometers. Can I find someone to fix it? Please help me."

"ග්‍රෑන්ඩ්පා, මයි කා(ර්) බ්‍රෝක් ඩවුන්. ඉට්ස් ජස්ට් ඩවුන් ද රෝඩ්, අබවුට් ෆිෆ්ටි මීට(ර්)ස් අවේ," චරිත් එක්ස්ප්ලේන්ඩ්, පොයින්ටිං බැක් ටුවෝඩ් හිස් කා(ර්). "අයි හෑව් ටු ඩ්‍රයිව් අනද(ර්) ටෙන් කිලෝමීට(ර්)ස්. කැනයි ෆයින්ඩ් සම්වන් ටු ෆික්ස් ඉට්? ප්ලීස් හෙල්ප් මී."

"සීයේ , මගේ කාර් එක කැඩුනා .ඒක අර පාරේ පහල , මීටර් 50 ක් විතර එහා" .ඔහුගේ කාරය දෙසට අත දිගු කරමින් චරිත් පැහැදිලි කළේය ."මට තව කිලෝමීටර් 10ක් යන්න තියෙනවා, මට කාව හරි හොයාගන්න පුලුවන්ද ඒක හදා ගන්න , අනේ මට උදව් කරන්නකෝ "

The old man didn't speak. He just nodded and signaled for Charith to follow him. Charith felt a bit relieved, finally, someone was going to help.

දි ඕල්ඩ් මෑන් ඩිඩ්න්ට් ස්පීක්. හි ජස්ට් නොඩඩ් ඇන්ඩ් සිග්නල්ඩ් ෆෝ චරිත් ටු ෆොලෝ හිම්. චරිත් ෆෙල්ට් අ බිට් රිලීව්ඩ්, ෆයිනලි, සම්වන් වෝස් ගොයිං ටු හෙල්ප්.

මහලු මිනිසා කතා නොකළේය . ඔහු නිකම් ඔලුව වනා චරිත්ට තමන් පසුපස එන්නැයි සංඥා කළේය . චරිත්ට මඳ සහනයක් දැනුනි, අවසානයේ යමෙකු ඔහුට උදව් කරන්නට ඉදිරිපත්ව සිටියේය

The old man walked slowly without saying a word. Charith followed him silently. It was now completely dark. After about 5 minutes, Charith noticed they were no longer on a road, they were walking through a small jungle path.

දි ඕල්ඩ් මෑන් වෝක්ඩ් ස්ලෝලි විතවුට් සේයිං අ ව(ර්)ඩ්. චරිත් ෆොලෝ(ව්)ඩ් හිම් සයිලන්ට්ලි. ඉට් වෝස් නව් කම්ප්ලීට්ලි ඩාක්. ආෆ්ට(ර්) අබවුට් ෆයිව් මිනිට්ස්, චරිත් නෝටිස්ඩ් දේ ව(ර්) නෝ ලෝංග(ර්) ඔන් අ රෝඩ් , දේ ව(ර්) වෝකිං ත්රූ අ ස්මෝල් ජංගල් පාත්.

මහලු මිනිසා වචනයකුදු කතා නොකර ගමන් කළේය. චරිත් නිහඬව ඔහු පසුපස ගමන් කළේය . මේ වෙනකොට සම්පූර්නයෙන්ම අඳුර වැටී තිබුණි. විනාඩි පහකට පමණ පසු ඔවුන් තව දුරටත් පාරක ගමන නොකරන බව චරිත් දුටුවේය. ඔවුන් ගමන් කරමින් සිටියේ කුඩා කැළෑ පාරකය .

"Grandpa, where are we going?" Charith asked, stepping carefully.
"ග්‍රෑන්ඩ්පා, වෙයා ආ වී ගොයිං?" චරිත් ආස්ක්ඩ් , ස්ටෙපිං කෙයාෆුලි.
"සීයේ, අපි කොහෙද මේ යන්නේ ?" පරිස්සමට අඩිය තබමින් චරිත් ඇසුවේය .

The old man didn't answer.
ද ඕල්ඩ් මෑන් ඩිඩ්න්ට් ආන්ස(ර්).
මහලු මිනිසා පිළිතුරු නොදුන්නේය

He asked again, “Grandpa?” But there was still no reply.
හී ආස්ක්ඩ් අගේන්, "ග්‍රෑන්ඩ්පා?" බට් දෙයා වෝස් ස්ටිල් නෝ රිප්ලයි.
ඔහු නැවත ඇසුවේය . “සීයේ ?’ නමුත් කිසිඳු පිළිතුරක් නොවුනි

Charith looked up, and to his horror, the old man was gone.
චරිත් ලුක්ඩ් අප් , ඇන්ඩ් ටු හිස් හොර(ර්), දි ඕල්ඩ් මෑන් වෝස් ගෝන්.
චරිත් හිස ඔසවා බැලුවේය. ඔහුගේ මහත් භීතියට , මහලු මිනිසා අතුරුදන්ව සිටියේය (horror - මහත් බිය )

"Grandpa?" he called out, waving his torch in all directions. But all he could see were trees and darkness. He had never felt so afraid in his life. He turned and ran, screaming for help.

"ග්‍රෑන්ඩ්පා?" හී කෝල්ඩ් අවුට්, වේවිං හිස් ටෝච් ඉන් ඕල් ඩිරෙක්ෂන්ස්. බට් ඕල් හී කුඩ් සී ව(ර්) ට්‍රීස් ඇන්ඩ් ඩාක්නස්. හී හෑඩ් නෙව(ර්) ෆෙල්ට් සෝ අෆ්‍රේඩ් ඉන් හිස් ලයිෆ්. හී ට(ර්)න්ඩ් ඇන්ඩ් රෑන්, ස්ක්‍රීමිං ෆෝ හෙල්ප්.

“සීයේ “ සෑම අතටම විදුලි පන්දම වනමින් ඔහු හඬ ගෑවේය .ඔහුට දැක ගත හැකිවුනේ ගස් කොලන් සහ අඳුර පමණි . ඔහුගේ ජිවිතයේ කිසිඳු දිනක ඔහුට මෙතරම් භීතියක් දැනී නොතිබුණි . යටි ගිරියෙන් කෑගසමින් ඔහු ආපසු හැරී දිව ගියේය . (scream - ස්ක්‍රීම් - යටි ගිරියෙන් කෑගහනවා )

The next morning, Charith woke up to see a ceiling fan spinning wildly above him. He felt exhausted. When he tried to move, his whole body ached, as if he had been beaten up

ද නෙක්ස්ට් මෝනිං, චරිත් වෝක් අප් ටු සී අ සීලිං ෆෑන් ස්පිනිං වයිල්ඩ්ලි අබව් හිම්. හී ෆෙල්ට් එග්සෝස්ටඩ්. වෙන් හී ට්‍රයිඩ් ටු මූව්, හිස් හෝල් බොඩි ඒක්ඩ් , ඈස් ඉෆ් හී හැඩ් බීන් බීට්න් අප්

පසුදා උදෑසන චරිත්ට ඇහැරෙන විට දැකගත හැකි වූයේ තමන්ට ඉහලින් වියරුවෙන් කැරකෙන විදුලි පංකාවකි. ඔහුට දැඩි වෙහෙසක් දැනුනි .ඔහු සෙලවීමට උත්සාහ කල විට, හරියට පහර කෑවාක් මෙන් ඔහුගේ මුළු ඇඟම රිදුම් දුනි. (as if - වගේ ) (spin - කැරකෙනවා ) (ache - රිදෙනවා ) (beaten up - පහර කෑ )(wildly - මෙහිදී අර්ථය ඉතා වේගයෙන් )

He looked around, confused. Just then, a nurse came up to him with a gentle smile.
හී ලුක්ඩ් අරවුන්ඩ්, කන්ෆියුස්ඩ්. ජස්ට් දෙන්, අ න(ර්)ස් කේම් අප් ටු හිම් විත් අ ජෙන්ටිල් ස්මයිල්.
වික්ෂිප්ත භාවයට පත්ව ඔහු වටපිට බැලුවේය .එවිටම කාරුණික සිනහවක් සමඟ හෙදියක ඔහු වෙතට පැමිණියාය

"Hi, good morning. How are you feeling now?" she asked kindly.
"හායි, ගුඩ් මෝනිං. හව් ආ යූ ෆීලිං නව් ?" ෂී ආස්ක්ඩ් කයින්ඩ්ලි.
“හායි , ගුඩ් මෝනිං , ඔයාට දැන් කොහොමද ?” ඇය කාරුණිකව ඇසුවාය

"I’m okay, Miss. But where am I?" Charith asked, still puzzled
"අයිම් ඕකේ, මිස්. බට් වෙයා ඇම් අයි?" චරිත් ආස්ක්ඩ් , ස්ටිල් පස්ල්ඩ්.
“මම ඕකේ මිස් , නමුත් මේ කොහෙද ඉන්නේ ? “ තවමත් ගැටලුකාරීව ඔහු ඇසුවේය

"You’re at Hatton Hospital."
"යූ ආ ඇට් හැටින් හොස්පිටල්."
“ඔයා ඉන්නේ හැටන් ඉස්පිරිතාලේ “

"Why am I here?"
"වයි ඇම් අයි හියර්(ර්)?"
“ මම ඇයි මෙහෙ ? “

"You were found by a villager lying beside a road," the nurse explained.
"යූ ව(ර්) ෆවුන්ඩ් බයි අ විලේජ(ර්) ලයිං බිසයිඩ් අ රෝඩ්," ද න(ර්)ස් එක්ස්ප්ලේන්ඩ්.
“ඔයාව හොයාගත්තේ පාරේ වැටිලා ඉන්නකොට ගමේ කෙනෙක් “ හෙදිය පැහැදිලි කලාය

"He brought you here with the help of a few others. He said you were found near a by-road leading to a cemetery. He also said you’re lucky to be alive. The police came last night and took statements from the villagers."

"හී බ්‍රෝට් යූ හිය(ර්) විත් ද හෙල්ප් ඔෆ් අ ෆිව් අද(ර්)ස්. හී සේඩ් යූ ව(ර්) ෆවුන්ඩ් නිය(ර්) අ බයි රෝඩ් ලීඩිං ටු අ සෙමෙට්‍රි. හී ඕල්සෝ සේඩ් යූ ආ ලකී ටු බී අලයිව්. ද පලීස් කේම් ලාස්ට් නයිට් ඇන්ඩ් ටුක් ස්ටේට්මන්ට්ස් ෆ්‍රොම් ද විලේජ(ර්)ස්."

“ඔහු ඔයාව මෙහෙට ගෙනාව තව කීප දෙනෙකුගේ සහායෙන් .ඔහු කිව්වා ඔයා කනත්තකට යන අතුරු පාරක් ළඟ වැටිලා හිටියා කියලා . ඔයා ජීවත් වෙන්න තරම් වාසනාවන්තයි කියලත් එයා කිව්වා . ඊයේ රෑ පොලිසිය ඇවිත් ගම්මුන්ගෙන් ප්‍රකාශ සටහන් කරගත්තා ” (statement - ප්‍රකාශය )

Charith tried hard to remember what had happened. He remembered driving to the remote holiday bungalow he had booked for the weekend. He remembered the car breaking down. But after that - nothing. His memory was blank.

චරිත් ට්‍රයිඩ් හාඩ් ටු රිමෙම්බ(ර්) වට් හෑඩ් හැපන්ඩ්. හී රිමෙම්බ(ර්)ඩ් ඩ්‍රයිවිං ටු ද රිමෝට් හොලිඩේ බංගලෝ හී හෑඩ් බුක්ඩ් ෆෝ ද වීකෙන්ඩ්. හී රිමෙම්බ(ර්)ඩ් ද කා(ර්) බ්‍රේකිං ඩවුන්. බට් ආෆ්ට(ර්) දැට් - නතිං. හිස් මෙමරි වෝස් බ්ලෑන්ක්.

සිදුවුනේ කුමක්දැයි මතක් කර ගැනීමට චරිත් දැඩි උත්සාහයක් ගත්තේය . සති අන්තය සඳහා තමා වෙන්කොට තිබූ ඒ දුර ඈත නිවාඩු නිකේතනය වෙත රිය පදවමින් සිටිනු ඔහුට මතක තිබුණි . කාරය ක්‍රියා විරහිත වෙනුද ඔහුට මතක තිබුණි . ඊට පසු කිසිවක් (මතකයේ ) නොතිබුණි .(ඉන් පසු ) ඔහුගේ මතකය හිස් විය (blank - හිස් ) (remote - රිමෝට් - දුර , ඈත )

"Where's my car, Miss?" he asked.
"වෙයාස් මයි කා(ර්), මිස්?" හි ආස්ක්ඩ් .
මගේ කාර් එක කොහෙද, මිස් ? ඔහු ඇසුවේය

"They found it about 200 meters away from where you were lying," she said.
"දේ ෆවුන්ඩ් ඉට් අබවුට් ටූ හන්ඩ්‍රඩ් මීට(ර්)ස් අවේ ෆ්‍රොම් වෙයා යූ ව(ර්) ලයිං," ෂී සේඩ්.
"ඔවුන්ට ඒක හම්බ වෙලා තිබුනා ඔයා වැටිලා හිටපු තැනට මීටර් දෙසීයක් විතර දුරින්

Charith stared at the ceiling, trying to piece together the strange and terrifying events of the night before.

චරිත් ස්ටෙයාඩ් ඇට් ද සීලිං, ට්‍රයිං ටු පීස් ටුගෙද(ර්) ද ස්ට්‍රේන්ජ් ඇන්ඩ් ටෙරිෆයිං ඉවෙන්ට්ස් ඔෆ් ද නයිට් බිෆෝ(ර්).

පෙර දින රාත්‍රියේ වූ අරුම සහ බිය ජනක සිදුවීම් එකිනෙක අමුණා ගැනීමට උත්සහ කරමින් චරිත් සීලිම දෙස බලා සිටියේය (piece together - එකට ඇදනවා) (terrifying - බිය ජනක )

The nurse smiled again and gently patted his arm. "Don't worry, we've(we have) already contacted your family using the phone numbers saved on your mobile.

ද න(ර්)ස් ස්මයිල්ඩ් අගේන් ඇන්ඩ් ජෙන්ට්ලි පැටඩ් හිස් ආම්. "ඩෝන්ට් වොරි, වී'ව් ඕල්රෙඩි කන්ටැක්ටඩ් යුව(ර්) ෆැමිලි යූසිං ද ෆෝන් නම්බ(ර්)ස් සේව්ඩ් ඔන් යුව(ර්) මොබයිල්.

හෙදිය යලිත් සිනාසී ඔහුගේ අතට සෙමින් තට්ටු කලාය " ඒ ගැන වොරි වෙන්න එපා , අපි දනටමත් ඔයාගේ පවුලේ අයට දැනුම් දීලා තියෙන්නේ ඔයාගේ ෆෝන් එකේ තිබුණු නම්බර්ස් වලින් (pat -තට්ටු කරනවා )

They were very worried, but we told them you're safe now. They're on their way to see you and should be here soon." She paused for a moment, then added, The most important thing is that you're safe and recovering."

දේ ව(ර්) වෙරි වොරීඩ්, බට් වී ටෝල්ඩ් දෙම් යූ ආ සේෆ් නව් . දේ ආ ඔන් දෙයා වේ ටූ සී යූ ඇන්ඩ් ෂුඩ් බී හියර්) සූන්." ෂී පෝස්ඩ් ෆෝ අ මෝමන්ට්, දෙන් ඇඩඩ්, "ද මෝස්ට් ඉම්පෝටන්ට් තිං ඉස් දැට් යූ ආ සේෆ් ඇන්ඩ් රිකවරිං."

ඒ ගොල්ලෝ බය වුනා නමුත් අපි ඒගොල්ලන්ට කිව්වා ඔයා ආරක්ෂිතයි කියලා . ඒගොල්ලෝ ඔයාව බලන්න එන ගමන් , ඒගොල්ලෝ කොයි වෙලාවක හරි මෙහෙ ඉදියි , " ඇය මොහොතක් නතරව යලි කතා කලාය " වැදගත්ම දේ තමයි ඔයා ආරක්ෂිතව ඉන්න එක සහ හොද වෙමින් ඉන්න එක " (pause - නතර වෙනවා )

Charith sighed. More than what had happened, he was worried about facing his mother's wrath. She had warned him not to go alone.

චරිත් සයිඩ්. මෝ(ර්) දෑන් වට් හෑඩ් හැපන්ඩ්, හී වෝස් වොරීඩ් අබවුට් ෆේසිං හිස් මද(ර්)ස් රොත් . ෂී හෑඩ් වෝන්ඩ් හිම් නොට් ටු ගෝ අලෝන්.

චරිත් සුසුමක් හෙලුවේය . සිදුවුනු දෙයට වඩා ඔහු බෙහෙවින් බියට පත් වූයේ තම මවගේ කෝපයට මුහුණ දීම පිලිබඳවය . තනියම නොයන ලෙස ඇය ඔහුට අවවාද කර තිබුණි (sigh - සුසුම් හෙලනවා ) (wrath - රොත් - කෝපය )

**Language Focus** 67

අපි මුලින්ම බලමු මේ වාක්‍යය

He began to regret starting his journey so late
හී බිගෑන් ටු රිග්‍රෙට් ස්ටාටිං හිස් ජ(ර්)නි සෝ ලේට්
තම ගමන බොහෝ ප්‍රමාද වී ආරම්භ කිරීම ගැන ඔහු පසුතැවිලි වීමට පටන් ගත්තේය

- Regret - රිග්‍රෙට් කියන්නේ කනගාටු වෙනවා / පසුතැවිලි වෙනවා කියන එක . පසුතැවිලි වෙන්නේ තමන් කරපු දෙයක් ගැන නම් ඒ ක්‍රියාව එන්නේ ing රූපයෙන්

I regret trusting him
අයි රිග්‍රෙට් ට්‍රස්ට්ං හිම්
ඔහුව විශ්වාස කළ එක ගැන මම කනගාටුවෙනවා / පසුතැවෙනවා.

I regret giving him money
අයි රිග්‍රෙට් ගිවිං හිම් මනි
මම ඔහුට මුදල් දුන් එක ගැන පසුතැවෙනවා/ කනගාටු වෙනවා

I regret buying this vehicle
අයි රිග්‍රෙට් බයිං දිස් වෙහිකල්
මම මේ වාහනය මිලදී ගත් එක ගැන පසුතැවෙනවා / කනගාටු වෙනවා

He regretted leaving his country
හී රිග්‍රෙටඩ් ලීවිං හිස් කන්ට්‍රි
ඔහුගේ රට හැර ගිය එක ගැන ඔහු පසුතැවුණා / කනගාටුවුනා

I regret saying that
අයි රිග්‍රෙට් සේයිං දැට්
මම ඒක කියපු එක ගැන පසුතැවෙනවා/ කනගාටු වෙනවා

She regretted  telling him all the secrets.
ෂී  රිග්‍රෙටඩ්  ටෙලිං හිම් ඕල් ද සීක්‍රට්ස්
ඔක්කොම රහස් ඔහුට කියපු එක ගැන ඇය පසුතැවුනා

She regrets not studying harder.
ෂී රිග්‍රෙට්ස් නොට් ස්ටඩීං හාඩ(ර්)
තවත් උත්සාහයෙන් පාඩම් නොකළ එක ගැන ඇය පසුතැවෙනවා

- එහි නැතාර්ථය මෙහෙම කියන්නත් පුළුවන්

I do not regret helping her.
අයි ඩූ නොට් රිග්‍රෙට් හෙල්පිං හ(ර්)
මට පසුතැවෙන්නේ නැහැ ඇයට උදව් කල එක ගැන

She did not regret telling the truth.
ෂී ඩිඩ් නොට් රිග්‍රෙට් ටෙලිං ද ට්‍රෘත්
ඇත්ත කියපු එක ගැන ඇය පසුතැවිලි වුනේ නැහැ

- ඊළගට අපි ගන්නේ මේ වාක්‍යය

Charith waited for him to come closer
චරිත් වේටඩ් ෆෝ හිම් ටු කම් ක්ලෝස(ර්)
චරිත් ඔහු ලඟට එනතුරු බලා සිටියා

- මේ රටාවටම ගත තවත් වාක්‍යය කිහිපයක් බලමු

She waited for the bus to arrive
ෂී වේටඩ් ෆෝ ද  බස් ටු අරයිව්
ඇය බස් එක පැමිණෙනතුරු බලා සිටියා

They waited for the rain to stop
දේ වේටඩ් ෆෝ ද  රේන් ටු ස්ටොප්
ඔවුන් වැස්ස  නවතින තුරු බලා සිටියා

He waited for his friend to call him
හී වේටඩ් ෆෝ හිස් ෆ්‍රෙන්ඩ් ටු කෝල් හිම්
ඔහු තම මිතුරා ඔහුට කතා කරනතුරු බලා සිටියා

We waited for the train to pass
වී වේටඩ් ෆෝ ද ට්‍රේන් ටු පාස්
අපි කෝච්චිය යනකල් බලන් හිටියා

She waited for the child to fall asleep.
ෂී වේටඩ් ෆෝ ද චයිල්ඩ් ටු ෆෝල් ඇස්ලීප්
ඇය දරුවා නිදා ගන්නතුරු බලා සිටියා

- ඊළඟට අපිට ඉහත හමුවුණු මේ වාක්‍යය දෙක බලන්න

I’m on my way to Hatton
අයිම් ඔන් මයි වේ ටු හැටන්
මම හැටන් වලට යන ගමන්

They’re on their way to see you
දේ ආ ඔන් දෙයා වේ ටු සී යූ
ඔවුන් ඔයාව බලන්න එන ගමන්

- On (one ‘s ) way - මෙය හොඳ යෙදුමක් මින් අදහස් වෙන්නේ ඒ පුද්ගලයා යම් තැනකට යන ගමන් කියන එක , ඒ කියන්නේ එයා මඟ කියන එක
on (one’s) way to යෙදෙන තවත් උදාහරණ කීපයක් බලමු

They’re on their way to the party
දේ ආ ඔන් දෙයා වේ ටු ද පාටි
ඔවුන් සාදයට යන ගමන්

I’m on my way to pick you up
අයිම් ඔන් මයි වේ ටු පික් යූ අප්
මම ඔයාව ගන්න එන ගමන්

She’s on her way to the office
ෂී’ස් ඔන් හ(ර්) වේ ටු ද ඔෆිස්
ඇය කාර්යාලයට යන ගමන්

We were on our way to the hospital
වී ව(ර්) ඔන් අව(ර්) වේ ටු ද හොස්පිටල්
අපි රෝහලට යන ගමන් හිටියේ

He was on his way to meet her
හී වෝස් ඔන් හිස් වේ ටු මීට් හ(ර්)
ඔහු ඇයව හමුවෙන්න යන ගමන් හිටියේ

Don’t worry. I’m on my way
ඩෝන්ට් වොරි . අයිම් ඔන් මයි වේ
බය වෙන්න එපා . මම මඟ එන ගමන්

- ඊළඟට මේ වාක්‍යය . මෙහි look කියන වචනෙන් අදහස් වෙන්නේ “පෙනෙනවා” කියන එක

The house looked old and run-down
ද හවුස් ලුක්ඩ් ඕල්ඩ් ඇන්ඩ් රන් ඩවුන්
ගෙය පරණ සහ අබලන් බව පෙනුනි

මේ රටාවටම එන තවත් වාක්‍යය කිහිපයක් ගනිමු

The road looked narrow and dangerous
ද රෝඩ් ලුක්ඩ් නැරෝ ඇන්ඩ් ඩේන්ජරස්
පාර පටු සහ භයානක බව පෙනුනි

The boy looked tired and hungry
ද බෝයි ලුක්ඩ් ටය(ර්)ඩ් ඇන්ඩ් හංග්‍රි
කොල්ලාට මහන්සි සහ බඩගිනි බව පෙනුනි

The room looked clean and quiet
ද රූම් ලුක්ඩ් ක්ලීන් ඇන්ඩ් ක්වයට්
කාමරය පිරිසිදු සහ නිස්කලංක බව පෙනුනි

The place looked dark and empty
ද ප්ලේස් ලුක්ඩ් ඩාක් ඇන්ඩ් එම්ටි
එම ස්ථානය අඳුරු සහ හිස් බව පෙනුනි

The man looked calm and confident
ද මෑන් ලුක්ඩ් කාම් ඇන්ඩ් කොන්ෆිඩන්ට්
මිනිසා සන්සුන් සහ ආත්ම විශ්වාසයෙන් යුක්ත බව පෙනුනි

The village looked quiet and peaceful
ද විලේජ් ලුක්ඩ් ක්වයට් ඇන්ඩ් පීස්ෆුල්
ගම නිහඬ සහ සාමකාමී බව පෙනුනි

The car looked new and expensive
ද කා(ර්) ලුක්ඩ් නිව් ඇන්ඩ් එක්ස්පෙන්සිව්
මෝටර් රථය අලුත් සහ මිල අධික බව පෙනුනි

- ඊළඟට මේ වාක්‍යය

The old man walked slowly without saying a word
ද ඕල්ඩ් මෑන් වෝක්ඩ් ස්ලෝව්ලි විතවුට් සේයිං අ ව(ර්)ඩ්
මහලු මිනිසා වචනයක්වත් නොකියා නිහඬව ගමන් කළේය

- මෙහි without saying කියන කොටස ගනිමු . Without එක්ක ක්‍රියා පදයක ing රූපය ආවම ඒ ක්‍රියාව “ නොකර “ කියන අදහස එනවා . අපි බලමු ඒ රටාවට තවත් උදාහරණ

She left the room without closing the door
ෂී ලෙෆ්ට් ද රූම් විතවුට් ක්ලෝසිං ද ඩෝ
දොර වහන්නේ නැතුව ඇය කාමරයෙන් පිටව ගියාය

The boy ran away without looking back
ද බෝයි රෑන් අවේ විතවුට් ලුකිං බැක්
පිරිමි ළමයා පසුපස නොබලා දුව ගියා

He answered the question without thinking
හී ආන්ස(ර්)ඩ් ද ක්වෙස්චන් විතවුට් තිංකිං
ඔහු හිතන්නේ නැතුව ප්‍රශ්නයට පිළිතුරු දුන්නා

She went to sleep without finishing her homework
ෂී වෙන්ට් ටු ස්ලීප් විතවුට් ෆිනිෂිං හ(ර්) හෝම්ව(ර්)ක්
ඇය හෝම් ව(ර්)ක් නොකර නින්දට ගියා

He entered the house without knocking
හී එන්ට(ර්)ඩ් ද හවුස් විතවුට් නොකිං
ඔහු තට්ටු නොකර ගෙට ඇතුළු වුණා

The girl locked the gate without making a sound
ද ග(ර්)ල් ලොක්ඩ් ද ගේට් විතවුට් මේකිං අ සවුන්ඩ්
ගැහැණු ළමයා ශබ්දයක් නොකර ගේට්ටුව ලොක් කරා

She read the article without understanding it
ෂී රෙඩ් ද ආටිකල් විතවුට් අන්ඩස්ටෑන්ඩිං ඉට්
ඇය තේරුම් නොගෙන ලිපිය කියවුවාය

The child crossed the road without looking both ways
ද චයිල්ඩ් ක්‍රොස්ඩ් ද රෝඩ් විතවුට් ලුකිං බෝත් වේස්
ළමයා දෙපැත්තම බලන්නේ නැතිව පාර හරහා පැන්නා

- ඊළඟට මේ වාක්‍යය . මේක ටිකක් advanced වාක්‍යයක්

But all he could see were trees and darkness
බට් ඕල් හී කුඩ් සී ව(ර්) ට්‍රීස් ඇන්ඩ් ඩාක්නස්
නමුත් ඔහුට දැකගත හැකි වූයේ ගස්කොලන් සහ අඳුර පමණි

මේ රටාවටම තවත් වාක්‍යය කිහිපයක් ගනිමු

All he could see were empty roads
ඕල් හී කුඩ් සී වර්) එම්ටි රෝඩ්ස්
ඔහුට පෙනුනේ හිස් පාරවල් පමණි

All they could see were tall buildings
ඕල් දේ කුඩ් සී වර්) ටෝල් බිල්ඩිංස්
ඔවුන්ට පෙනුනේ උස ගොඩනැගිලි පමණි

All we could see were dark clouds
ඕල් වී කුඩ් සී වර්) ඩාක් ක්ලවුඩ්ස්
අපට පෙනුනේ අඳුරු වලාකුළු පමණි

All he could see were broken houses
ඕල් හී කුඩ් සී වර්) බ්‍රෝකන් හවුසස්
ඔවුන්ට පෙනුනේ බිඳුණු ගෙවල් පමණි

All we could see were bright lights
ඕල් වී කුඩ් සී වර්) බ්‍රයිට් ලයිට්ස්
අපට පෙනුනේ දීප්තිමත් එලි පමණි

All they could see were open fields
ඕල් දේ කුඩ් සී වර්) ඕපන් ෆීල්ඩ්ස්
ඔවුන්ට පෙනුනේ විවෘත ගොවි බිම් පමණි

- ඉහත වාක්‍යය හැම එකකම බහු වචන තමයි කතෘ වුනේ . ඒ නිසයි were යෙදුනේ . අපි ඒක වචන කතෘ කෙනෙක් ඉන්න වාක්‍යය කීපයකුත් බලමු

All he could see was darkness
ඕල් හී කුඩ් සී වෝස් ඩාක්නස්
ඔහුට පෙනුනේ අඳුර පමණි

All we could see was fog
ඕල් වී කුඩ් සී වෝස් ෆොග්
අපිට පෙනුනේ මීදුම පමණි

All we could see was fire
ඕල් වී කුඩ් සී වෝස් ෆයර්)
අපිට පෙනුනේ ගින්දර පමණි

All we could see was water all around us
ඕල් වී  කුඩ් සී වෝස් වෝට(ර්) ඕල් අරවුන්ඩ් අස්
අපට අප අවට සෑම තැනම  පෙනුනේ වතුර  පමණි

- අපි see කියන ක්‍රියා පදය වෙනුවට hear කියන ක්‍රියාපදය ගනිමු

All he could hear was silence
ඕල් හී කුඩ් හියර්) වෝස් සයිලන්ස්
ඔහුට ඇසුණේ නිහඬතාවය පමණි

All we could hear was the wind
ඕල් වී  කුඩ් හිය(ර්) වෝස් ද වින්ඩ්
අපට ඇසුණේ සුළඟ පමණි

All he could hear was a distant bird call
ඕල් හී කුඩ් හිය(ර්) වෝස් අ ඩිස්ටන්ට් බ(ර්)ඩ් කෝල්
ඔහුට ඇසුණේ දුරස්ථ කුරුළු හඬ ගැසීමක් පමණි

- ඊළඟට අපිට ඉහත මුණගැසුණු මේ වාක්‍යය බලන්න

He remembered driving to the remote holiday bungalow he had booked for the weekend

හී  රිමෙම්බ(ර්)ඩ් ඩ්‍රයිවිං ටු ද රිමෝට් හොලිඩේ බංගලෝ හී  හෑඩ් බුක්ඩ්  ෆෝ ද වීකෙන්ඩ්.

සති අන්තය සඳහා තමා වෙන්කොට තිබූ ඒ දුර ඈත නිවාඩු නිකේතනය වෙත රිය පදවමින් සිටිනු ඔහුට මතක තිබුණි

- මෙහි holiday bungalow he had booked for the weekend කියන කොටසට අවධානය යොමු කරන්න
  මෙහි Relative pronoun එකක් තියෙනවා (ඔබට නැවත මතක් කර ගත හැකියි Relative pronoun පිලිබඳ පාඩම 48 Lesson )  නමුත් එය සැඟවී තිබෙන්නෙ .මෙය කියවෙන්න ඕන මේ විදියට
  .. holiday bungalow that/ which  he had booked for the weekend
  ඔහු සති අන්තය සඳහා බුක් කල නිවාඩු බංගලාව
  ඇතැම් විට වාක්‍යයක  relative pronoun එක යෙදෙන්නේ නැහැ , නමුත් එතන එය තිබෙන බව අපි වටහා ගත යුතුයි , නැතිනම් වාක්‍යයේ  තේරුම අපට නිවැරදිව වටහා ගන්න බැහැ. . පහත වාක්‍යය වල that හෝ whcih  යෙදෙන්න ඕන කොතනද කියලා ඔබ හඳුනාගන්න උත්සාහ කරන්න

He picked up the bag he had left on the bus
හී පික්ඩ් අප් ද බෑග් හී හෑඩ් ලෙෆ්ට් ඔන් ද බස්
ඔහු බස් එකේ දාල ගිය බෑග් එක ඔහු ආපහු ගත්තා

They found the key they had lost in the dark
දේ ෆවුන්ඩ් ද කී දේ හැඩ් ලොස්ට් ඉන් ද ඩාක්
කළුවරේ ඔවුන් නැතිකරගත්තු යතුර ඔවුන්ට හම්බ වුනා

I met the man you spoke about yesterday
අයි මෙට් ද මෑන් යූ ස්පෝක් අබවුට් යෙස්ටඩේ
ඔයා ඊයේ කියපු මිනිහව මට හම්බ වුනා

She read the letter her father had written to her
ෂී රෙඩ් ද ලෙට(ර්) හ(ර්) ෆාදර් හැඩ් රිට්න් ටු හ(ර්)
ඇගේ පියා ඇයට ලියා තිබූ ලිපිය ඇය කියෙව්වා

We stayed in the hotel we had booked online
වී ස්ටේඩ් ඉන් ද හොටෙල් වී හෑඩ් බුක්ඩ් ඔන්ලයින්
අපි ඔන්ලයින් බුක් කරපු හෝටලයේ නතර වුනා

She called the friend she met at the party
ෂී කෝල්ඩ් ද ෆ්‍රෙන්ඩ් ෂී මෙට් ඇට් ද පාටි
ඇය පාසලේදී හමුවූ මිතුරාට කතා කළා

I ate the cake my mother made yesterday
අයි ඒට් ද කේක් මයි මද(ර්) මේඩ් යෙස්ටඩේ
ඊයේ අම්ම හදපු කේක් එක මම කෑවා

**Vocabulary 67**

Drizzle – ඩ්‍රිස්ල් – වැසි පොද වැටෙනවා

Narrow – නැරෝ – පටු

hill path – හිල් පාත් – කඳු මාර්ගය

Destination – ඩෙස්ටිනේෂන් – ගමනාන්තය

Estimate – එස්ටිමේට් – ඇස්තමේන්තු කරනවා (අතීත – Estimated – එස්ටිමේටඩ්)

Pause – පෝස් – නවතිනවා / කෙටි විරාමයක් ගන්නවා

Regret – රිග්‍රෙට් – පසුතැවෙනවා

Just then – ජස්ට් දෙන් – එතකොටම

Figure – ෆිග(ර්) – රූපයක් / පුද්ගල රූපය

Approach – අප්‍රෝච් – ළඟට එනවා / ළඟා වෙනවා

Interest – ඉන්ටරෙස්ට් – උනන්දුව

Strange – ස්ට්‍රේන්ජ් – අමුතු / විකාර

Pass by – පාස් බයි – පසුකර යනවා (අතීත – Passed by – පාස්ට් බයි)

Break down – බ්‍රේක් ඩවුන් – ක්‍රියා විරහිත වෙනවා ( Broke down - අතීත )

Directly – ඩිරෙක්ට්ලි – සෘජුවම

Instead – ඉන්ස්ටෙඩ් – වෙනුවට

Point – පොයින්ට් – පෙන්වනවා

Roadside – රෝඩ්සයිඩ් – පාරඅයින

Gentleman – ජෙන්ටල්මන් – මහත්මයා

Softly – සොෆ්ට්ලි – මෘදු ලෙස

Sigh – සයි – සුසුම් හෙලනවා

Relief – රිලීෆ් – සැනසිල්ල / සැහැල්ලුව

Grab – ග්‍රෑබ් – අල්ලගන්නවා (අතීත – Grabbed – ග්‍රෑබ්ඩ්)

Run down – රන් ඩවුන් – අබලි , අබලන්

Verandah – වෙරැන්ඩා – ඉස්තෝප්පුව

Untidy – අන්ටයිඩි – අවුල් , අපිළිවෙල

Musty smell – මස්ටි ස්මෙල් – පුස් ගඳ

Response – රෙස්පොන්ස් – ප්‍රතිචාරය

Abandon – අබැන්ඩන් – අත්හැර දමනවා

Abandoned – අබැන්ඩන්ඩ් – අත්හැර දමන ලද

Creak – ක්‍රීක් – ක්‍රීස් ශබ්දය / කිරි කිරි හඬ නිකුත් කරනවා

Torch – ටෝච් – පන්දම

Burning torch – බ(ර්)නින් ටෝච් – දැල්වෙන පන්දම

Nod – නොඩ් – හිස සලනවා

Signal – සිග්නල් – ඉඟිය / සංඥාව

Relieved – රිලීව්ඩ් – සහනයට පත්

Horror – හොර(ර්) – භීතිය

Wave – වේව් – වනනවා

Direction – ඩිරෙක්ෂන් – දිශාව

Darkness – ඩාක්නස් – අඳුර

Scream – ස්ක්‍රීම් – කෑ ගසනවා

Spin – ස්පින් – වටේට කැරකෙනවා

Wildly – වයිල්ඩ්ලි – උමතු ලෙස, වියරුවෙන්

Exhausted – එග්සෝස්ටඩ් – හෙම්බත් වූ

Beat up – බීට් අප් – පහර දෙනවා

Beaten up – බීටන් අප් – පහර කෑමට ලක් වූ

Ache – ඒක් – වේදනාව / රිදෙනවා

Confused – කන්ෆියුස්ඩ් – අවුල් වූ

Gentle – ජෙන්ටල් – මෘදු

Gently - ජෙන්ට්ලි - මෘදුව , සෙමින්

Puzzled – පස්ල්ඩ් – වික්ෂිප්ත / අවුල් වූ

Cemetery – සෙමටරි – සුසාන භූමිය

By road – බයි රෝඩ් – අතුරු පාර

Alive – අලයිව් – පණ ඇති , පණ පිටින්

Statements – ස්ටේට්මන්ට්ස් – ප්‍රකාශ

Remote – රිමෝට් – දුරස්ථ

Blank – බ්ලෑන්ක් – හිස් / කිසිවක් නැති

Stare – ස්ටෙයා – දෑස් අයා බලනවා

Piece together – පීස් ටුගෙද(ර්) – එකට ඈඳනවා , කොටස් එකතු කර තේරුම් ගන්නවා

Terrify – ටෙරිෆයි – භය ගන්වනවා

Terrifying – ටෙරිෆයිං – භයංකර

Pat – පැට් – සැහැල්ලුවෙන් තට්ටු කරනවා

Gently – ජෙන්ට්ලි – මෘදු ලෙස

Recover – රිකව(ර්) – සුව වෙනවා

Wrath – රොත් – කෝපය